**නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2019**

---

නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ කණු මතින් ඉදිවන අධිවේගී මාර්ගයක් ඉදිකිරීම තුලින් රථවාහන තදබදය, ගමන් කාලය අඩු කිරීම, ආයෝජන හා රැකියා අවස්ථා වැඩිදියුණු කිරීම මෙන්ම දරිද්‍රතාව සහ විරැකියාව අවම කිරීමෙන් ආර්ථික කටයුතු මත ධනාත්මක බලපෑම් ඇති කිරීමයි.අධිවේගී මාර්ගයේ අදියර I හි අපේක්ෂිත පිරිවැය රුපියල් බිලියන 55 ක් ඇතුළත පවතින අතර 2021 නොවැම්බර් වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

---

මාගේ මතය,ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනයන් තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවයි.

## 1.4 මතය සඳහා පදනම

---

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම ,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා සත්‍ය බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා

බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2 භෞතික කාර්ය සාධනය

-------------------------

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

-----------------------------------------------

(අ) නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා 2016 මාර්තු 02 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. ව්‍යාපෘතිය අදියර 02 කින් සමන්විත වන අතර, පළමු අදියරට නව කැළණි පාලම සිට රාජගිරිය දක්වා කිලෝමීටර් 6.9ක් ඇතුලත් වන අතර දෙවන අදියරට රාජගිරිය සිට අතුරුගිරිය දක්වා කිලෝමීටර් 10.4 ක් ඇතුලත් වේ. පළමු අදියරේ ශක්‍යතා අධ්‍යයනය 2015 වර්ෂයේදී දක්ෂිණ අධිවේගී මාර්ගය කොළඹ දෙසට දිගුව ව්‍යාපෘතියේ විෂය පථය යටතේ නිම කර තිබුණි. අදියර දෙකෙහි ශක්‍යතා අධ්‍යයනය සමාජ සමීක්ෂණයට මහජන විරෝධය සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් මතු කරන ලද ගැටළු වල ප්‍රතිඵලයක් ලෙස සැලැස්ම සහ පෙළ ගැස්වීමේ පැතිකඩ නිරන්තරයෙන් වෙනස් කිරීම නිසා ප්‍රථමයෙන් එකඟ වූ කාලපරිච්ඡේදයේ සිට දින 294 ක ප්‍රමාදයකින් 2019 අගෝස්තු 22 දින සම්පූර්ණ කර ව්‍යාපෘතියට භාරදී ඇත. කෙසේ වෙතත්, අධිවේගී මාර්ගය පාරිසරික ආරක්ෂිත ප්‍රදේශයක් හරහා දිවෙන බැවින් පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව 2020 ජූලි 31 තෙක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කර නොමැත.

(ආ) නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ පැවරීමේ පදනම (BOT) යටතේ ශ්‍රී ලංකාවේ ඉදිවන පළමු ව්‍යාපෘතියයි. ආර්ථික කලමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් 2016 ජුනි 08 වන දින BOT පදනම මත යෝජනා සඳහා ආරාධනා කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2016 ජුනි 28 දින ලබාගෙන තිබුණි. ව්‍යාපෘතියේ අදියරයන් 02 හි ආයෝජනය සඳහා වෙනම කැමැත්ත ප්‍රකාශ කිරීම (EOI) සඳහා අනාගත ලංසුකරුවන්ට ආරාධනා කර තිබුණි. ඒ අනුව, පළමු අදියර සඳහා අයදුම්පත් 14 ක් සහ දෙවන අදියර සඳහා අයදුම්පත් 9 ක් ලැබී තිබුණි. පළමු අදියර සඳහා ලැබී ඇති කැමැත්ත ප්‍රකාශ කිරීම් 14 න්, සුදුසුකම්ලත් සමාගම් 9 ක් යෝජනා ඉල්ලීම් ලේඛන නිකුත් කිරීම සඳහා කෙටි ලැයිස්තුගත කර ඇත. ඒ අනුව "ලබාගත හැකි" පීපීපී - බීඕටී ආකෘතිය යටතේ ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා කෙටි ලැයිස්තුගත කර ඇති පාර්ශවයන්ගෙන් යෝජනා කැඳවීමට 2019 සැප්තැම්බර් 03 දින අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබාදී ඇත. කෙසේ වෙතත්, 2020 මැයි 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, කලින් පැවති කැබිනට් තීරණය අවලංගු කිරීමට සහ දැනටමත් අයෝජන මණ්ඩලයට ඉදිරිපත් කර ඇති සීමාසහිත චයිනා හාබර් ඉංජිනේරු සමාගමේ ආයෝජන යෝජනාව ඇගයීම සඳහා ආයෝජන මණ්ඩලය සමඟ කටයුතු කිරීමට මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශයට අවසර දී ඇත.

**2.2 නීති රීති හා රෙගුලාසි වලට යොමුව**

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 | ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් තහවුරු කරගත යුතුය. කෙසේවෙතත්, ව්‍යාපෘතිය කාර්ය මණ්ඩලයේ පැමිණීමේ හා පිටවීමේ වේලාවන් වාර්තා කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා නොකරන අතර සලකුණු යන්ත්‍රය භාවිතයෙන් පැමිණීම තහවුරු කර නොගෙන සමාලෝචිත වර්ෂය තුල අතිකාල දීමනා රු.1,728,104ක් ගෙවා තිබුණි. | බලය නොලත් ගෙවීම් කිරීමට හැකියාව ඇත. | සමාලෝචිත කාලසීමාව තුල ව්‍යාපෘති කාර්ය මණ්ඩයේ පැමිණීම සහ අතිකාල දීමනා ගෙවීම් තහවුරු කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකිරීම පිළිබඳ විගණකගේ අදහස් සමඟ මම එකඟ වේ. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමට පියවර ගත යුතුය. |

**2.3** **ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු**

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ අපේක්ෂිත ප්‍රගතිය සියයට 33 ක් වූ අතර ඊට එරෙහිව සත්‍ය ප්‍රගතිය සියයට 27 ක් විය. කෙසේවෙතත් ඉඩම් අත්පත් කර ගැනිමේ සහ නැවත පදිංචි කරවීමේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 වන විටත් 38 වන වගන්තිය ගැසට් කර නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමේදී ප්‍රමාදයන් සිදු විය හැක. | ව්‍යාපෘතියේ ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය 2019 දෙසැම්බර් 31 දින වන විට ඉලක්කගත මට්ටමට වඩා මදක් පිටුපසින් ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අනෙකුත් පාර්ශවකරුවන්නගේ මන්දගාමී කාර්ය සාධනයයි. ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අදාල නිලධාරීන්ගේ ක්‍රියාකාරීත්වය සෘජුවම බලපායි. | ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කිරීමට පියවර ගත යුතුය. |